# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

AAT/ 198 /2019 (NPC)

ඒ.කේ.පී.රත්නායක

**අභියාචක**

**එදිරිව**

ජාතික පොලිස් කොමිෂන් සභාව

**වගඋත්තරකරු**

**දිනය :-2025.07.24.**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

පෙනී සිටීම :- අභියාචක සිටී.

අභියාචක වෙනුවෙන් විශ්‍රාමික රජයේ සේවක තිස්ස ගුණතිලක මහතා.

වගඋත්තරකාර ජාතික පොලිස් කොමිෂන් සභාව වෙනුවෙන් නියෝජ්‍ය අධ්‍යක්ෂක, ආර්.එම්.එස්.පී.රත්නායක මහතා.

## <u>නියෝගය</u>

මෙම අභියාචනය විමසීමට ගත් අවස්ථාවේ දී අභියාචක වෙනුවෙන් පෙනී සිටින තිස්ස ගුණතිලක මහතා ඔහු විසින් ඉදිරිපත් කරන ලද 2025.07.16 දිනැති ලිඛිත දේශනයෙහි 02 වන පිටුවට විනිශ්චය අධිකාරයේ අවධානය යොමු කරමින්, එහි සඳහන් කරුණු සළකා බැලීමෙන් පසු මෙම අභියාචනය සම්බන්ධයෙන් නියෝගයක් කරන ලෙසට ඉල්ලා සිටී.

ඉහත කී ලිඛිත දේශනයෙහි දෙවන පිටුවෙහි සඳහන්ව ඇත්තේ, මෙම අභියාචකට විරුද්ධව පවත්වන ලද විධිමත් විනය පරීක්ෂණයේ දී සාක්ෂි ඉදිරිපත් කරන ලද ප්‍රධානතම සහ එකම සාක්ෂිකරු වන්නේ සහකාර පොලිස් අධිකාරී නිශාන්ත ද සොයිසා යන අය බවයි. එම නිලධාරියාම මෙම සිද්ධියට අදාළව, අභියාචකට එරෙහිව පැවැත්වූ මූලික විමර්ශනය පවත්වන ලද නිලධාරියාම බව ඔහු තවදුරටත් ප්‍රකාශ කර සිටී. එවැනි තත්ත්වයක් යටතේ අභියාචකට එරෙහිව පවත්වන ලද විධිමත් විනය පරීක්ෂණයේ සාක්ෂි වල වටිනාකමක් නොමැති බවත්, එබැවින් එවා නොසළකා හැරිය යුතු බවටත් කරුණු දක්වන ලදි. එය ස්වභාවික යුක්තියේ මූලධර්ම වලට පටහැනි බවටද ගුණතිලක මහතා විසින් තවදුරටත් කරුණු ඉදිරිපත් කර ඇත.

ජාතික පොලිස් කොමිෂන් සභාව වෙනුවෙන් පෙනී සිටින රත්නායක මහතා දන්වා සිටින්නේ, ඉහත කී සිද්ධිමය කරුණු එනම් නිශාන්ත ද සොයිසා විසින් මූලික විමර්ශනය පැවැත්වීම සහ විධිමත් විනය පරීක්ෂණයේ ප්‍රධාන සාක්ෂිකරු ඔහුම වීම යන කරුණු නිවැරදි බවයි. ඒ අනුව අභියාචකට එරෙහිව ඉදිරිපත් කර ඇති මෙම සිද්ධියට අදාළව මූලික විමර්ශනය පැවැත්වූ නිලධාරියා සහ විධිමත් විනය පරීක්ෂණයේ දී සාක්ෂි ඉදිරිපත් කර ඇති ප්‍රධානතම සාක්ෂිකරු සහකාර පොලිස් අධිකාරී නිශාන්ත ද සොයිසා නැමැති අය බව පැහැදිලිව පෙනී යයි.

විධිමත් විනය පරීක්ෂණය පැවැත් වූ පී.පී.විමලසිරි යන සහකාර පොලිස් අධිකාරීවරයාගේ වාර්තාවෙහි, එම විනය පරීක්ෂණයේ දී සාක්ෂි ලබාදී ඇති එක් එක් සාක්ෂිකරුවන්ගේ සාක්ෂි සම්පිණ්ඩනයක් ඉදිරිපත් කර ඇත. එම වාර්තාවට අනුව, රංජිත් සමරනායක යන අයගේ සාක්ෂියෙන් මෙම අභියාචකට විරුද්ධව කිසිදු කරුණක් හෙළිදරව් නොවන බවට ඔහු පවසා ඇත. එකී වාර්තාවට අනුව, පො.සැ.57621 අනුර ප්‍රකාශ කර ඇත්තේ, ඔහු දිවා සේවයේ රාජකාරී කළ බවත්, එදින කිසිදු සැකකරුවෙක් උපසේවයට භාරදීමක් කර නොමැති බවත් ය. පොලිස් සැරයන් 62383 සිසිර කුමාර, පො.කො.40109 තිලකරත්න, පොලිස් ආරක්ෂක සහායක 2662 නන්දසේන යන අයගේ සාක්ෂි සම්බන්ධයෙන් සළකා බැලුවද, අභියාචකට එරෙහිව කිසිදු සාක්ෂියක් ඉදිරිපත් වී නොමැත.

අභියාචක සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත්තේ, සිද්ධිය වූ අවස්ථාවේ සහකාර පොලිස් අධිකාරී නිශාන්ත ද සොයිසා එම ස්ථානයට පැමිණුන බවයි. සහකාර පොලිස් අධිකාරී නිශාන්ත ද සොයිසා ඔහුගේ සාක්ෂියෙන් පවසා ඇත්තේ, චෝදනාගාරය තුළ සිටි සියළු නිලධාරීන් අඩ නින්දේ පසුවූ බවයි. ඒ හැරෙන්නට අභියාචක සම්බන්ධයෙන් විශේෂ සඳහනක් කරමින්, ඔහු නිදා සිටි බවට සාක්ෂියක් ලබාදී නැත. ඒ අනුව විධිමත් විනය පරීක්ෂණයේ දී ඉදිරිපත් වී ඇති සාක්ෂි සළකා බැලුවද, අභියාචක වරදකරු කිරීමට තරම් සාක්ෂි ඉදිරිපත් නොවන බව පෙනී යයි.

එසේ නම් අභියාචක වෙත ඉදිරිපත් වූ චෝදනා වන,

I. අපකීර්තිදායක හැසිරීම.

පො.සැ.29245 රත්නායක වන ඔබ වැල්ලම්පිටිය පොලිස් ස්ථානයට අනුයුක්තව රාජකාරී කරමින් සිටියදී 2010.10.17 වන දින වැල්ලම්පිටිය පොලිස්ථානයේ රාත්‍රී කාර්ය භාර නිලධාරියා ලෙස රාජකාරී යොදවා තිබියදී රාජකාරී වේලාව තුල නිදා ගැනීම සහ නීත්‍යානුකූළ නොවන ලෙස සැකකරුවන් සිව් දෙනෙකු සිර මැදිරයේ රඳවා තබා ගැනීමෙන් දෙපාර්තමේන්තු නියෝග "ඒ 07 බී" පරිශිෂ්ඨයේ විනය සංග්‍රහයේ 01

වන වගන්තිය ප්‍රකාරව "අපකීර්තිදායක හැසිරීම" එනම් "අනිසි ලෙස හෝ විනය පවත්වා ගැනීමට හානි කරවන අන්දමින් හෝ පොලිස් සේවයේ හොඳ නමට කැළලක් විය හැකි අන්දමින් හෝ හැසිරීම" යන වරද සිදුකර ඇති බවට ඔබට මෙයින් චෝදනා කරමි.

II. අණට අකීකරුවීම

පො.සැ.29245 රත්නායක වන ඔබ වැල්ලම්පිටිය පොලිස් ස්ථානයට අනුයුක්තව රාජකාරි කරමින් සිටියදී 2010.10.17 වන දින වැල්ලම්පිටිය පොලිස්ථානයේ රාත්‍රී කාර්ය භාර නිලධාරියා ලෙස රාජකාරි යොදවා තිබියදී රාජකාරි වේලාව තුල නිදා ගැනීම සහ නීත්‍යානුකූළ නොවන ලෙස සැකකරුවන් සිව් දෙනෙකු සිර මැදිරයේ රඳවා තබා ගැනීමෙන් දෙපාර්තමේන්තු නියෝග "ඒ 07 බී" පරිශිෂ්ඨයේ 03 වන වගන්තිය ප්‍රකාරව "අණට අකීකරුවීම" එනම් "උසස් පොලිස් නිලධාරියෙකු ලියවිල්ලකින් හෝ අන්‍යාකාරයකින් නිකුත් කල යම් නියෝගයකට අකීකරුවීම හෝ නියෝගයක් ඉටු කිරීම පැහැර හැරීම හෝ අතපසු කිරීම" විනය සංග්‍රහයේ 01 වන වගන්තිය ප්‍රකාරව" යන වරද සිදුකර ඇති බවට ඔබට මෙයින් චෝදනා කරමි.

III. රාජකාරිය පැහැර හැරීම.

පො.සැ.29245 රත්නායක වන ඔබ වැල්ලම්පිටිය පොලිස් ස්ථානයට අනුයුක්තව රාජකාරි කරමින් සිටියදී 2010.10.17 වන දින වැල්ලම්පිටිය පොලිස්ථානයේ රාත්‍රී කාර්ය භාර නිලධාරියා ලෙස රාජකාරි යොදවා තිබියදී රාජකාරි වේලාව තුල නිදා ගැනීම සහ නීත්‍යානුකූළ නොවන ලෙස සැකකරුවන් සිව් දෙනෙකු සිර මැදිරයේ රඳවා තබා ගැනීමෙන් දෙපාර්තමේන්තු නියෝග "ඒ 07 බී" පරිශිෂ්ඨයේ විනය සංග්‍රහයේ 04(ඒ) වගන්තිය ප්‍රකාරව "**රාජකාරී පැහැර හැරීම**" එනම් "පොලිස් නිලධාරියෙකු වශයෙන් තමන් අයත් රාජකාරියක් වූ යම් කටයුත්තක් අප්‍රමාදව හා අනලස්ව සොයා බැලීම හෝ ඉටු කිරීම පැහැර හැරීම නැතහොත් අතපසු කිරීම" යන වරද සිදුකර ඇති බවට ඔබට මෙයින් චෝදනා කරමි.

1V. රාජකාරිය පැහැර හැරීම.

පො.සැ.29245 රත්නායක වන ඔබ වැල්ලම්පිටිය පොලිස් ස්ථානයට අනුයුක්තව රාජකාරි කරමින් සිටියදී 2010.10.17 වන දින වැල්ලම්පිටිය පොලිස්ථානයේ රාත්‍රී කාර්ය භාර නිලධාරියා ලෙස රාජකාරි යොදවා තිබියදී රාජකාරි වේලාව තුල නිදා ගැනීමෙන් දෙපාර්තමේන්තු නියෝග "ඒ 07 බී" පරිශිෂ්ඨයේ විනය සංග්‍රහයේ 04(බී) වගන්තිය ප්‍රකාරව "**රාජකාරී පැහැර හැරීම**" එනම් "**රාජකාරියේ යෙදී සිටියදී කම්මැලිකමින් කල් ගෙවීම**" යන වරද සිදුකර ඇති බවට ඔබට මෙයින් චෝදනා කරමි.

V. **බොරු කීම හෝ ඇත්ත සඟවා කථා කිරීම.**

**පො.සැ.29245 රත්නායක වන ඔබ වැල්ලම්පිටිය පොලිස් ස්ථානයට අනුයුක්තව රාජකාරි කරමින් සිටියදී 2010.10.17 වන දින වැල්ලම්පිටිය පොලිස්ථානයේ රාත්‍රී කාර්ය භාර නිලධාරියා ලෙස රාජකාරි යොදවා තිබියදී රාජකාරි වේලාව තුල නිදා ගැනීම සහ නීත්‍යානුකූළ නොවන ලෙස සැකකරුවන් සිව් දෙනෙකු සිර මැදිරියේ රඳවා තබා ගැනීමෙන් දෙපාර්තමේන්තු නියෝග "ඒ 07 බී" පරිශිෂ්ඨයේ විනය සංග්‍රහයේ 05(බී) වගන්තිය ප්‍රකාරව "බොරුකීම හෝ ඇත්ත සඟවා කතා කිරීම" එනම් "ඕනෑකමින්ම හෝ නොසැළකිලිමත්කමින් හෝ අසත්‍ය ප්‍රකාශයක්, මුලා කරන සුළු ප්‍රකාශයක් නැතහොත් වැරදි ප්‍රකාශයක් කිරීම" යන වරද සිදුකර ඇති බවට ඔබට මෙයින් චෝදනා කරමි."**
**යන චෝදනාවන්ට වරදකරු බවට පත්කිරීම දෝෂ සහගතවේ.**

**කෙසේ වෙතත් මේ අවස්ථාවේ දි පහත සඳහන් කරුණු සටහන් කර තැබීම යෝග්‍ය වන බවට තීරණය කරන ලදි.**

i. **කිසියම් වැටලීමකදී හෝ පරීක්ෂණයක් පවත්වන අවස්ථාවේ දී එම කරුණට සහභාගී වූ ප්‍රධාන පුද්ගලයා විසින්ම මූලික විමර්ශනය පැවැත්වීම නොකළ නොයුතුව තිබුණි. මෙම සිද්ධියේදී නිශාන්ත ද සොයිසා යන අය ප්‍රධාන සාක්ෂිකරු වන බව ඔහු හොඳින්ම දැන ගනිමින් සිද්ධිය සම්බන්ධව මූලික විමර්ශනය පැවැත්වීම සඳහා වෙනත් පුද්ගලයෙකු නම් කිරීමට, සහකාර පොලිස් අධිකාරිවරයෙකු ලෙස තනතුරක් දරණ ඔහුට වගකීමක් පැවරෙනවා ඇත. එම කාර්යය ඔහු විසින් සිදුකර නැත.**

ii. **මූලික විමර්ශනයක් වෙනත් පුද්ගලයෙකු විසින් සිදුකර ඇති බවට කිසිදු කරුණක් හෙළිදරව් නොවේ. මෙවැනි තත්ත්වයක් යටතේ, වැටලීම කරන ලද නිශාන්ත සොයිසා විසින්ම මූලික පරීක්ෂණය පැවැත්වීමෙන්, තමන්ගේ නඩුව තමන් විසින්ම ඇසීම නොකළ යුතුය යන ස්වභාවික යුක්තියේ මූලධර්මය කඩවන බව සඳහන් කළ යුතුය.**

iii. **මෙම සිද්ධියට අදාළ මූලික විමර්ශනය පිළිබඳ වාර්තාව ඉදිරිපත් කර ඇත්තේ, සිද්ධිය සිදුවී මාස දෙකකටත් පසුව බවට කරුණු ඉදිරිපත් වන අතර, එවැනි ප්‍රමාදයකින් යුක්තව කටයුතු නොකළ යුතු බව සඳහන් කළ යුතුය.**

iv. **මෙවැනි සිද්ධියකදී ආයතන සංග්‍රහයේ ලඝු කාර්ය පටිපාටිය යටතේ කටයුතු කරමින් එක් එක් පුද්ගලයාගෙන් නිදහසට**

කරුණු විමසා, ඒ අනුව නිසි දඬුවම් පැමිණුවේ නම්, ඉහත කී දෝෂයන් ඉදිරිපත් වන්නේ නැත. ඒ සමගම මෙම සිද්ධියේ දී අනවහ්‍ය හා අවිධිමත් අන්දමට විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීම හේතුවෙන් අනවශ්‍ය ලෙස මුදල් වියදම් වී ඇති අතර, කාලයද අපතේ ගොස් ඇති බවද සටහන් කළ යුතුය.

ඉහත කරුණු සළකා බලා, අභියාචකට එරෙහිව ලබාදී ඇති විනය නියෝගය වන වැටුප් වර්ධක දෙකක් විලම්භනය කිරීම නැමති නියෝගය ඒ ආකාරයෙන් පවත්වා ගෙන යාමට නොහැකි බවට තීරණය කරමු. ඒ අනුව එම දඬුවම ඉවත් කිරීමට තීරණය කරමින් ඒ අනුව නියෝග කරමු. මෙම නියෝගය ක්‍රියාත්මක කරන ලෙසට ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත දැනුම් දෙමු.

සියළු කරුණු සළකා බලා, අභියාචකගේ ඉල්ලීමට අවසර ලබාදෙමු.

අභියාචනයට අවසර ලබාදෙමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි.

(ජේ.ජේ.රත්නසිරි)
(සාමාජික)

මම එකඟ වෙමි

(එස්.නන්දසේකරන්)
(සාමාජික)

ලලිතා/-